




# රාජ්‍ය නර්තන උළෙල
# அரச நடன விழா
# State Dance Festival
# 2011

சி. ரவீந்திரன்
தமிழ் மொழி மூல விவாகப்பதிவாளர்
இல - 68/1, சென்மேரிஸ் ஒழுங்கை
கொழும்பு - 15

# රාජ්‍ය නර්තන උළෙල
# அரச நடன விழா
# 2011

2012 පෙබරවාරි මස 26 වැනි දින ප.ව. 6.00 ට
ජෝන් ද සිල්වා සමරු රංගහලේ දී...

2012 பெப்ரவரி மாதம் 26ம் திகதி பி.ப. 6.00 மணி
ஜோன் டி சில்வா ஞாபகார்த்த அரங்கில்

சி. ரவீந்திரன்
தமிழ் மொழி மூல விவாகப்பதிவாளர்
இல - 68/1, சென்மேரிஸ் ஒழுங்கை
கொழும்பு - 15

## රාජ්‍ය නර්තන උළෙල - 2011

සංස්කරණය
කල්‍යාණි අබේසිංහ
ජී.ඒ. ජිනප්‍රිය

දෙමළ මාධ්‍ය
ඒ. සුභාෂිණී
එස්. ශිවනේෂන්
වී. විජය රච්චහන්

පිටකවරය
නලින් සම්පත් කරුණාසේන

මුද්‍රණ කටයුතු සම්බන්ධීකරණය
ජේ.කේ.පී. ප්‍රේමසිරි

මුද්‍රණය
ෆාස්ට් ප්‍රින්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ්
165, දේවානම්පියතිස්ස මාවත,
කොළඹ 10.

ප්‍රකාශනය
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

## அரச நடன விழா - 2011

**தொகுப்பாசிரியர் குழு**
கல்யாணி அபேசிங்ஹ
ஜி.ஏ. ஜினப்பிரிய

அ. சுபாஷினி — (தமிழ் மூலம்)
வி. விஜயரட்சகன்
சி. சிவநேசன்

**அட்டைப் படம்**
நளின் சம்பத் கருணாசேன

**பதிப்பு ஒருங்கிணைப்பு**
ஜெ.கே.பீ. பிரேமசிறி

**அச்சு**
பாஸ்ட் பிறின்டரி (பிறெய்வெட்) லிமிடெட்
165, தேவானம்பியதிஸ்ஸ மாவத்தை,
கொழும்பு 10.

**வெளியீடு**
கலாசார அலுவல்கள் திணைக்களம்

## රාජ්‍ය නර්තන උළෙල - 2011

මාර්ගෝපදේශකත්වය

**ටී.බී. ඒකනායක**
(සංස්කෘතික හා කලා කටයුතු ගරු අමාත්‍ය)

විමල් රුබසිංහ
(ලේකම් - සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය)

අධීක්ෂණය
විජිත් කණුගල
(සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ)

මෙහෙයවීම
ඉන්දික මන්ත්‍රීරත්න
(නියෝජ්‍ය අධ්‍යක්ෂ)

උදානි වරුසවිතාන
(සහකාර අධ්‍යක්ෂ)

ශ්‍රීමති සෙනෙවිරත්න
(පරිපාලන නිලධාරිනි)

උපදේශකත්වය
රවිබන්ධු විද්‍යාපති
(සභාපති - රාජ්‍ය නර්තන හා මුද්‍රා නාට්‍ය අනුමණ්ඩලය)
මහාචාර්ය ලයනල් බෙන්තරගේ
(උප සභාපති - රාජ්‍ය නර්තන හා මුද්‍රා නාට්‍ය අනුමණ්ඩලය)

සමස්ත සම්බන්ධීකරණය
විජේපාල විජේසේකර
(සංස්කෘතික නිලධාරි)
(ලේකම් - රාජ්‍ය නර්තන හා මුද්‍රා නාට්‍ය අනුමණ්ඩලය)

නිලක්ෂි වජිරා නැව්ගල
(සංස්කෘතික සංවර්ධන සහකාර)
(සහකාර ලේකම් - රාජ්‍ය නර්තන හා මුද්‍රා නාට්‍ය අනුමණ්ඩලය)

රුවන් ලාල් නිශාන්ත
(සංස්කෘතික සංවර්ධන සහකාර)

## அரச நடன விழா - 2011

**வழிகாட்டல்**
**ரி.பி. ஏக்கநாயக்க**
கலாசார மற்றும் கலை அலுவல்கள் அமைச்சர்

**விமல் ரூபசிங்க**
(செயலாளர் — கலாசார மற்றும் கலை அலுவல்கள் அமைச்சு)

**மேற்பார்வை**
**விஜித் கணுகல**
(கலாசார அலுவல்கள் பணிப்பாளர்)

**ஏற்பாடு**
**இந்திக மந்திரிரத்ன**
(பிரதிப் பணிப்பாளர்)

**சி.எச்.பி. லியனாரச்சி**
(கணக்காளர்)

**உதானி வருஷவிதான**
(உதவிப் பணிப்பாளர்)

**ஸ்ரீமதி செனவிரட்ன**
(நிர்வாக உத்தியோகத்தர்)

**ஆலோசனை**
**ரவிபந்து வித்தியாபதி**
(தலைவர் — அரச நடன மற்றும் நாட்டிய நாடகக் குழு)
பேராசிரியர் லயனல் பெந்தரகே
(உபதலைவர் — அரச நடன மற்றும் நாட்டிய நாடகக் குழு)

**பூரண ஒருங்கமைப்பு**
**விஜயபால விஜயசேகர**
(கலாசார உத்தியோகத்தர்)
(செயலாளர் — அரச நடன மற்றும் நாட்டிய நாடகக் குழு)

**நிலக்ஷி வஜிரா நவ்கள**
(கலாசார அபிவிருத்தி உத்தியோகத்தர்)
(உதவிச் செயலாளர் — அரச நடன மற்றும் நாட்டிய நாடகக் குழு)

**ருவான் லால் நிஷாந்த**
(கலாசார அபிவிருத்தி உத்தியோகத்தர்)

## ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ විධායක සභාව

| | |
|---|---|
| මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහතා | - සභාපති |
| මහාචාර්ය සමන්ත හේරත් මහතා | - විධායක සභික |
| ආචාර්ය සෝමරත්න දිසානායක මහතා | - විධායක සභික |
| ආචාර්ය රෝහණ වීරසිංහ මහතා | - විධායක සභික |
| කථිකාචාර්ය විශ්වනාදන් සදානන්දන් මහතා | - විධායක සභික |
| කමල් බී. දිසානායක මහතා | - ලේකම් |

## රාජ්‍ය නර්තන හා මුද්‍රා නාට්‍ය අනුමණ්ඩලය

| | |
|---|---|
| රවිබන්ධු විද්‍යාපති මහතා | - සභාපති |
| පියසාර ශිල්පාධිපති මහතා | - සාමාජික |
| මහාචාර්ය ලයනල් බෙන්තරගේ මහතා | - සාමාජික |
| ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය | - සාමාජික |
| චන්න විජේවර්ධන මහතා | - සාමාජික |
| චන්දන වික්‍රමසිංහ මහතා | - සාමාජික |
| මහින්ද කුමාර විමලසිරි මහතා | - සාමාජික |
| අසේල රංගදේව මහතා | - සාමාජික |
| අරුන්දති ශ්‍රී රංගනාදන් මහත්මිය | - සාමාජික |
| සුමතිපාල ශිල්පාධිපති මහතා | - සාමාජික |
| ජනනාත් වරකාගොඩ මහතා | - සාමාජික |
| ස්වර්ණා නාලනී මිහිරිපැන්න මහත්මිය | - සාමාජික |
| අසංක ප්‍රසාද් තිලකරත්න මහතා | - සාමාජික |
| විජේපාල විජේසේකර මහතා | - ලේකම් |
| නිලක්ෂි වජිරා නැව්ගල මෙනවිය | - සහකාර ලේකම් |

## இலங்கை கலைக் கழகத்தின் நிறைவேற்றுச் சபை

| | | |
|---|---|---|
| தலைவர் | — | பேராசிரியர் காலோ பொன்சேகா |
| உறுப்பினர்கள் | — | கலாநிதி ரோஹண வீரசிங்க |
| | | பேராசிரியர் சோமரத்ன திசாநாயக்க |
| | | பேராசிரியர் சமந்த ஹேரத் |
| | | விரிவுரையாளர் விஸ்வநாதன் சதானந்தன் |
| செயலாளர் | — | கமல் பீ. திசாநாயக்க |

## அரச நடன மற்றும் நாட்டிய நாடகக் குழு

| | | |
|---|---|---|
| தலைவர் | — | ரவிபந்து வித்யாபதி |
| உறுப்பினர்கள் | — | பியசார ஷில்பாதிபதி |
| | | கலாசூரி அருந்ததி ஸ்ரீரங்கநாதன் |
| | | பேராசிரியர் லயனல் பெந்தரகே |
| | | சன்ன விஜேவர்தன |
| | | சுமதிபால ஷில்பாதிபதி |
| | | சுவர்ணா நாளனீ மிஹிரிபென்ன |
| | | கலாநிதி ஷிரியானி ராஜபக்ஷ |
| | | சந்தன விக்ரமசிங்க |
| | | ஜயநாத் வரகாகொட |
| | | மஹிந்த விமலசிரி |
| | | அசேல ரங்கதேவ |
| | | அசங்க பிரசாத் திலகரத்ன |
| செயலாளர் | — | விஜேபால விஜேசேகர |
| உதவிச் செயலாளர் | — | நிலக்ஷி வஜிரா நவ்கல |



# සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගේ පණිවිඩය
# கலாசார மற்றும் கலை அலுவல்கள் அமைச்சரின் செய்தி

නර්තන ශිල්පඥානය ශ්‍රී ලාංකිකයන්ගේ පාරම්පරික දායාදයකි. කුසලතාවයකි. එසේ ම ශ්‍රී ලාංකික දේශීයත්වය ලොව හමුවේ ප්‍රකට කරන ප්‍රබල සන්නිවේදනාත්මක කලා මාධ්‍යයකි. ගැමි ජනවහරේ නැටුම් යනුවෙන් හැඳින්වෙන කලාත්මක සහ සෞන්දර්යාත්මක විෂයයක් වන නර්තනය මව් උකුළේ සිට ම දරුවාට හුරු පුරුදු වේ. මුවගට සිනාව නංවමින් මවු උකුල මත රංගනයේ යෙදෙන දරුවා කායික හා මානසික සුවයක් අත්විඳ ගනිති. නර්තන කලාව පිළිබඳව ජාතික සංස්කෘතික උරුමය මුලින්ම අපට හමුවන්නේ මේ ලෙසින් ය.

දේශීය නර්තන සම්ප්‍රදායත්‍රයට අමතරව නව වන්නම් නිර්මාණ ඇසුරු කර ගනිමින් සිංහල දමිළ ද්විභාෂා මාධ්‍යයෙන් ම නර්තන කුසලතා ඇගයීමට ලක් කිරීම විශේෂත්වයක් ගෙන තිබේ. සමස්ත ලංකාව ම ආවරණය වන පරිදි කලායතන සංස්කෘතික මධ්‍යස්ථාන සහ පාසල් කේන්ද්‍ර කරගනිමින් නර්තන කුසලතා ඇගැයුමට ලක් කරමින් ප්‍රවීණ සහ අංකුර නර්තන ශිල්පීන්ට සම්මාන ප්‍රදානය කරන මොහොත හැඟීම්බරය, සුන්දරය, අසිරිමත් ය.

ශ්‍රී ලාංකික නර්තන කලා කෙත අස්වද්දන්නට මහින්ද චින්තනය යටතේ සැකසුණු 2011 රාජ්‍ය නර්තන උළෙල හා සම්මාන ප්‍රදානෝත්සවය සාර්ථක කර ගැනීමට දායක වූ නර්තනවේදීන්ට, පාසල් දරු දැරියන් ප්‍රමුඛ සියලු දෙනාටම හෘදයාංගම කෘතඥතාවය පළ කරමි. නර්තන කලාවේ උන්නතිය උදෙසා 2011 රාජ්‍ය නර්තන සම්මාන ප්‍රදානෝත්සවය ඉමහත් සවියක් වේවා යි ප්‍රාර්ථනා කරමි.

**ටී.බී. ඒකනායක**
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍ය
2012 පෙබරවාරි මස 26 වැනි දින දීය

நடன கலை அறிவு இலங்கையர்களின் பாரம்பரிய சொத்தாகும். திறமையாகும். அதுப்போலவே இலங்கையின் தனி அடயாளத்தை உலகத்தினிடையில் பரப்புகின்ற ஒரு பிரபல தொடர்பாடல் சார் கலை ஊடகமாகும். நாட்டார் வழக்கில் ஸ்ரீஆடல்' என்று அழைக்கப்படுகின்ற கலைசார்ந்த மற்றும் சௌந்தரியமான ஒரு விடயமாகின்ற தாய் மடியில் இருந்தே குழந்தைக்கு பழக்கமாகி வரப்படுகின்றது. வாயில் மலருகின்ற சிரிப்புடன் தாயின் மடியில் இருந்து நடனமாடுகின்ற சிசு உள உடல் சுவை பெறுவர். நடன கலை தொடர்பாக தேசிய கலாசார உரிமைகள் எமக்கு இவ்வாறே முதல் முதலாக கிடைக்கின்றது.

உள்நாட்டு நடன பாரம்பரியங்களுக்கு மேலதிகமாக புதிய ஆக்கங்களை உபயோகித்து சிங்கள மற்றும் தமிழ் எனும் ஈர் மொழி மூலமும் நடன ஆற்றல்களை மதிப்பீட்டுக்கு பாத்திரப்படுத்துதல் ஒரு முக்கியத்துவத்தை கொண்டுள்ளது. அகில இலங்கை ரீதியில், கலை நிறுவனங்கள், கலாசார நிலையங்கள் மற்றும் பாடசாலைகளை மத்திய நிலையங்களாகக் கொண்டு நடன திறமைகளை மதிப்பீட்டுக்கு பாத்திரப்படுத்தி நிபுண மற்றும் இளைய நடன கலைஞர்களுக்கு விருதுகள் வழங்குகின்ற இச் சந்தர்ப்பம் உணர்வுப்பூர்வமானது. சௌந்தரியமானது. அதிசயமானது.

இலங்கையின் நடன துறையினை வளம் பெறச் செய்திட மஹிந்த சிந்தனையின் கீழ் ஏற்பாடு செய்யப்பட்டுள்ள 2011 நடன விழா மற்றும் விருதுகள் வழங்கும் வைபவத்தை சிறப்புப் படுத்திக்கொள்வதில் பங்கேற்றிய நடன கலைஞர்களுக்கு பாடசாலை பிள்ளைகள் உட்பட்ட அனைவருக்கும் மனமார்ந்த நன்றியினை வழங்குகின்றேன். நடன கலையின் வளர்சிக்காக 2011 ஆம் ஆண்டின் நடன விருதுகள் வழங்கும் பெருவிழா பெரும் பலமாக அமைய வேண்டுமென பிரார்திக்கின்றேன்.

**ரி.பீ.ஏக்கநாயக்க**
அமைச்சர் அலுவலகம்.
கலாசார மற்றும் கலை அலுவல்கள் அமைச்சர்
2012.02.26



## සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

## கலாசார மற்றும் கலை அலுவல்கள் அமைச்சு செயலாளரின் வாழ்த்துச் செய்தி

ශ්‍රී ලංකාවේ නර්තන කලාවට දිගුකාලීන ඉතිහාසයක් ඇත. ප්‍රාග් බෞද්ධ යුගයේ පටන් ඓතිහාසික සාධකවලින් සනාථ වනදෙශීය නර්තන කලාව අනුරාධපුර යුගයේ දී බෞද්ධාගමික සංකල්ප සමඟින් පෝෂණය වී වඩාත් කලඑළි දකිනු පෙනේ. ශ්‍රී ලංකාවේ රාජධානී මුල් කර ගත් යුගයෙන් යුගය ජන සමාජයේ පැවැත්මත් නර්තන කලාවේ පැවැත්මත් සමගාමී ව පෙරට ගමන් කර තිබේ. කොළඹ රාජධානී නව ආණ්ඩුක්‍රම පාලන තන්ත්‍රයත් සමඟ විවිධ සංස්කෘතික අංගෝපාංග එක් වෙමින් දේශීය නර්තන කලාව නව මඟකට යොමු වූ බව ද සඳහන් කළ හැකිය.

උඩරට, පහතරට, සබරගමු යන සම්ප්‍රදායත්‍රයේ ශාන්තිකර්ම ඇසුරෙන් ජන කරළියට නැඟුණු නර්තනාංග පොදු ජනතා මානසික ප්‍රබෝධයට මෙන් ම සුවයට ද පිටුබලයක් වී තිබේ. ගුප්ත ශාස්ත්‍රීය සංකල්පවල මූලික අංගයක් ද වන නර්තනය පුද්ගලයාගේ කායික මානසික සුවය සැලසීමට ඉවහල් වන බව ද පිළිගත් මතයකි. මේ අයුරින් පුද්ගලයාගේ ජීවිතය සමඟ ඉතා සමීප සම්බන්ධතාවක් පවතින දේශීය අනන්‍යතාව තහවුරු කරන නර්තන කලාව වඩාත් පෝෂණය කරමින් නර්තන කලාවේදීන්ගේ සුබසාධනය සහ කුසලතා වර්ධනයට වාර්ෂිකව සංවිධානය කරන රාජ්‍ය නර්තන උළෙල සිංහල, දමිළ භාෂාද්වයෙන් ම පවත්වන්නට ලැබීම 'මහින්ද චින්තන' වැඩ පිළිවෙළෙහි සක්‍රීය ජයග්‍රහණයකි.

සමස්ත ශ්‍රී ලංකාව ම ආවරණය වන පරිදි සංස්කෘතික මධ්‍යස්ථාන කලායතන සහ පාසල් කේන්ද්‍ර කරගනිමින් කුසලතා ඇගයීමට ලක් වූ අංකුර හා ප්‍රවීණ නර්තනවේදීන්ට ඉදිරි ගමනට සවියක් වන රාජ්‍ය නර්තන සම්මාන ප්‍රදානෝත්සවය සර්වප්‍රකාරයෙන් ම සාර්ථක වේවා යි ප්‍රාර්ථනා කරමි.

### විමල් රූබසිංහ

ලේකම්

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

2012 පෙරබවාරි මස 26 වැනි දින දීය.

இலங்கையின் நடன கலைக்கு ஒரு நீண்ட வரலாறு இருக்கின்றது. பௌத்த வரலாற்றுக்கு முற்பட்ட காலம் முதல் வரலாற்று மிகுந்த காரணங்களால் உறுதியாகின்ற உள்நாட்டு நடன கலை அனுராதபுரம் காலத்தின் போது பௌத்த சங்கற்பங்களால் வளர்ச்சியடைந்து பாவனையில் இருப்பதை காணலாம். இலங்கையில் இராசதானியங்களை அடிப்படையாகக் கொண்ட யுகத்திற்கு யுகமாக ஜன சமுதாயத்தின் நிலைப்பாடும் நடனக் கலையின் நிலைப்பாடும் ஒன்றாக இணைந்தே முன்வந்துள்ளது. கொழும்பு இராசதானிகள், புதிய ஆட்சி அதிகாரங்களுடன் பலதரப்பட்ட கலாசார அங்கங்கள் இணைந்து உள்நாட்டு நடன கலை புதிய ஓருவழியை கொண்டிருப்பதாகவும் காணலாம்.

உடரட்ட, பகதரட்ட, சப்ரகமுவை எனும் மூவகையான பாரம்பரியத்தின் சாந்திக் கருமங்கள் மூலம் மக்கள் மேடையில் ஆடப்பட்ட நடன அங்கங்களால் பொது மக்களின் உள மகிழ்சிக்கு போன்றெ உள சுவைக்கும் பக்கபலமாக அமைந்துள்ளது. மறைமுகமான கலை அம்சங்களின் ஒரு அடிப்படையான உறுப்பாகவம் கருதப்படுகின்ற நடனம் மனிதனின் உடல் உள சுவையை ஏற்படுத்துவதற்கும் சாதகமாகின்றது என்பதும் ஒரு ஏற்றுக்கொள்ளப்பட்ட கருத்தாகின்றது. இவ்வாறு மனிதனின் வாழ்வுடன் மிகவும் நெருக்கமான தொடர்ப்புகளை கொண்ட, எமது நாட்டின் அடையாளத்தை உறுதிபடுத்தகின்ற நடனக் கலை மேலும் வளர்த்து நடன கலைஞர்களின் நல் வாழ்வை மற்றும் கலை ஆற்றல்களின் முன்னேற்றத்திற்காக ஆண்டுதோறும் ஏற்பாடு செய்கின்ற அரச நடன விழா சிங்கள, தமிழ் இரு மொழிகள் மூலம் நடாத்துவதற்கு வாய்ப்பேற்பட்டமை 'மஹிந்த சிந்தனை' வேலை திட்டத்தின் செயன்முறை வெற்றியாகும்.

அகில இலங்கை ரீதியில் கலாசார நிலையங்கள், கலை நிறுவனங்கள் மற்றும் பாடசாலைகளை மையமாகக் கொண்டு நடனத் திறமைகள் மதிப்பீடுக்கு உட்படுத்தப்பட்டு இளைய மற்றும் நிபுண நடன கலைஞர்களின் எதிர் காலத்திற்கு ஒரு சக்தியாக அமைகின்ற அரச நடன விருதுகள் வழங்கும் விழா சகல விதத்திலும் வெற்றிபெற வேண்டும் என பிரார்திக்கின்றேன்.

### விமல் ரூபசிங்க

செயலாளர்

கலாசார மற்றும் கலை அலுவல்கள் அமைச்சு

2012.02.26 ஆம் திகதி.



# සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය

කිසියම් රටක ජාතික සිරිත් විරිත්, ඇවතුම් පැවතුම්, ඇදහිලි, විශ්වාස, පුරාවෘත, ජනශ්‍රැති. සාරධර්ම හා ගුණධර්ම යනාදිය විනිවිද දකින්නට කැමති අයෙකුවේ නම් හෙතෙම අදාළ රටෙහි නර්තනය පරිශීලනය කළ යුතුය."

සැබැවින්ම නර්තනය වූ කලී රටක් සතු ජාතික උරුමයකි. ගායනය, වාදනය, නාට්‍ය ආදි ලලිත කලාවන් හි ආදිතම කලාව වන්නේ ද නර්තනය යි. එබැවින් විෂයයක් වශයෙන් ගත් කළ යම් කාල වකවානුවක කිසියම් රටක හෝ ප්‍රදේශයක සංස්කෘතිකමය ස්වභාවය හා ඓතිහාසික ප්‍රපංචයන් අධ්‍යනයට මනා පිටුබලයක් නර්තන විෂය ආශ්‍රයෙන් නොලැබෙන්නේ යැයි තර්ක කළ නොහැක.

කරුණු කෙසේ වෙතත් සෙසු ලලිත කලා මාධ්‍යයන් හි මෙන්ම නර්තනයෙහි ද අරමුණ වනුයේ කිසියම් ප්‍රපංචයක් ශිල්පියාගේ ආත්මීය සංකල්ප හා මුසු කොට සමාජගත කිරීමයි. ඒ ඔස්සේ වඩාත් සංවේදී හා ප්‍රඥාසම්පන්න සමාජයක් බිහිවේ නම් නිර්මාණය මෙන්ම නිර්මාණ කරුවා ද ශ්‍රේෂ්ඨත්වයට පත් වන්නේ ය. එදා මෙදා තුර නර්තන කලාව ඔස්සේ ශ්‍රී ලාංකේය ලකුණ ජාත්‍යන්තරයට ගෙන යෑමටත්, කුසලතා පූර්ණ නර්තන ශිල්පීන් පිරිසක් දැයට දායාද කරන්නටත් දිවි හිමියෙන් කැපවූ සුවිශිෂ්ට යුග පුරුෂයන්ගේ දායකත්වය කිසි විටෙකත් අමතක කළ නොහැක.

එකී පූර්වාදර්ශයන් අනුව යමින් ද, දේශීය නර්තන කලාවේ ඇති රුව ගුණ ක්ෂණිකව වෙනස්වන ලෝකය සමඟ ගලපා ගනිමින් වුවත් එහි ආත්මය ආරක්ෂා කරගනිමින් ද හරසුන් බොල් චලනයන් නර්තනය ලෙසින් හඳුන්වා දෙන මෙවන් යුගයක උඩුගං බලා පිහිනන සැබෑ නිර්මාණකරුවන් පිරිසක් බිහිවනු දැකීම සැබැවින්ම සතුටට කරුණකි.

එකී නිර්මාණකරුවන් රාජ්‍ය මට්ටමෙන් ඇගයීම හා ධෛර්යමත් කිරීම සංස්කෘතික හා කලා ක්ෂේත්‍රයේ කටයුතු කරන සැමගේ වගකීම වියයුතු බව මාගේ පිළිගැනීමයි.

උතුර - දකුණ යා කෙරෙන යෝධ සංස්කෘතික ප්‍රවාහයක තවත් එක් මංගල දියවරක් වශයෙන් රාජ්‍ය නර්තන උළෙල හඳුන්වා දිය හැක්කේ සිංහල - දෙමළ සහෝදරත්වයේ සුවඳ ද මෙම තරගාවලිය ඔස්සේ මුළු දිවයින පුරාම විහිදී ගිය බැවිනි.

2011 රාජ්‍ය නර්තන තරගාවලිය අරමුණු කරගෙන විශිෂ්ට නිර්මාණ ඉදිරිපත් කරමින් ස්වකීය ශ්‍රමය, ධනය හා කාලය කැප කළ නර්තන නිර්මාණ ශිල්පීන් වෙත සුබ පැතුම් එක්කරන අතරම, විචිත්‍රවත් හා අභිමානවත් අයුරින් උළෙල සංවිධානය කිරීම සඳහා මහත් පරිශ්‍රමයක් දැරූ ශ්‍රී ලංකා කලා මණ්ඩලයටත්, රාජ්‍ය නර්තන හා මුද්‍රා නාට්‍ය අනුමණ්ඩලයේ සභාපති රවිබන්ධු විද්‍යාපති මහතා ප්‍රමුඛ සාමාජික භවතුන්ටත්, නන් අයුරින් සහයෝගය දැක්වූ සැමටත් මාගේ කෘතඥතා පූර්වක ස්තුතිය පුදකර සිටිමි.


## විජිත් කණුගල

සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව


2012 පෙබරවාරි මස 26 වැනි දින දීය.



## கலாசார அலுவல்கள் திணைக்களப் பணிப்பாளரின் நல்வாழ்துச் செய்தி

'ஏதேனுமொரு நாட்டில் தேசிய பழக்க வழக்கங்கள், நடைமுறைகள், நம்பிக்கைகள், வழிபாடுகள், பாரம்பரிய கதைகள், நாட்டார் கதைகள், நல்லொழுக்கங்கள் நற்பண்புகள், குணாதிசியங்கள் என்பவை தொடர்பான தெளிவை பெறுவதற்கென்றால் உரிய நாட்டின் நடனக் கலை தொடர்பான அறிவை பெற்றிருந்தல் வேண்டும்.'

உண்மையிலேயே நடனம் என்பது ஒரு நாட்டின் தேசிய மரபுரிமையாகும். பாடல், இசைத்தல், நாடகம் போன்ற அழகியற் கலைகளின் மிகத் தொன்மையான கலையாக இருப்பதும் நடனக் கலையே. ஆகையால் ஒரு விடையமாகக் கொண்டு பாக்கின்ற போது ஒரு கால கட்டத்தின் போது ஏதேனும் ஒரு நாட்டில் அல்லது பிரதேசத்தின் கலாசார நிலைப்பாடு மற்றும் வரலாற்று அமைப்பை கற்றலுக்கு உரிய ஊக்கத்தை நடன விடயம் ஊடாக ஏற்பட மாட்டாதென தர்க ரிதியில் கூற முடியாது.

எவ்வாறாயினும், ஏனைய கவின்கலைகளைப் போன்றே நடனக் கலை தொடர்பாகவும் நோக்கமாக அமைவது, ஏற்கனவே நடைபெற்ற, நடைபெறுகின்ற அல்லது நடைபெறக் கூடிய ஏதேனுமொரு சந்தர்பத்தை ஒரு கலைஞனின் ஆத்மாவுடன் இணைந்திருக்கும் சங்கற்பங்களுடன் சேர்த்து மக்களிடம் வழங்குவதாகும். இதன் மூலம் எளிதில் உணர்ச்சி வசப்படக்கூடிய மற்றும் ஞானம் நிரம்பிய ஒரு சமுதாயத்தை உருவாக்கப்படும் என்றால் ஆக்கம் போன்றே ஆக்கவாளரும் சிறப்படைவர். அன்று முதல் இன்று வரை நடன கலையின் ஊடாக இலங்கை அடையாளங்களை சர்வதேச தளத்திற்கு கொண்டு செய்வதற்கும், ஆற்றல்களை னொண்ட நடன கலைஞாகளின் ஒரு கூட்டத்தை நாட்டுக்கு பெற்றுக்கொடுப்பதில் பெரும் அர்ப்பணத்துடன் செயற்பட்ட- போன்ற மாமனிதர்களின் பங்கேற்பை எப்பொதுமே மறந்திட முடியாது.

அம் முன் அனுபவங்களுக்கேற்ப மற்றும் உள்நாட்டு நடன கலையில் காணக்கூடிய வடிவங்களை, கணப்பொழுதில் மாற்றமடைகின்ற உலகத்துடன் பொருத்தப்பட்டதாயினும் அதன் உடகருவை அழியாது பேணப்பட்டும் பொருளற்ற, பதர் உடலசைவுகளை நடனம் என்று அறிமுகப்படுத்துகின்ற இத்தகைய ஒரு காலகட்டத்தில் மாற்று விதிகளை தேடி பயணிக்கும் உண்மையான கலைஞர்கள் கூட்டம் உருவாகுவதை காணுவது உண்மையிலயே மகிழ்சியை ஏற்படுத்துகின்றது.

சிங்கள – தமிழ் சகோதரத்துவத்தின் வாசனையும் இப் போட்டித் தொடர் மூலம் எமது நாடு முழுவதுமே பரந்துப்போய்யிருப்பதால் வடக்கு–தெற்கு திசைகளை ஒன்றிணைக்கும் பிரமாண்டமான கலாசார தொடரின் இன்னுமொரு மைல் கல்லாக அரச நடன விழாவை அறிமுகப்படுத்திட முடியும்.

2011 – அரச நடன போட்டித் தொடரை இலக்காகக் கொண்டு சிறந்த ஆக்கங்களை சமர்பித்து தமது உழைப்பு, சொத்து மற்றும் காலத்தை அர்ப்பணித்த நடன ஆக்கமாளர்களிடம் நல்வாழ்துக்களை வழங்குவதோடு, விசித்திரமானதாகவும், ஆடம்பரமானதாகவும் இவ் விழாவினை ஏற்பாடு செய்வதில் பெருமுயற்சி கொண்டிருக்கும் இலங்கை கலைக் கழக அரச நடன, நாட்டிய நடன மற்றும் பொம்மலாட்ட சபையின் தலைவர் திரு.ரவிபந்து வித்தியாபதி அவர்கள் உட்பட உறுப்பினர்களுக்கும், பல வகையில் உதவிய அனைவருக்கும் எனது மனமார்ந்த நன்றியினை வழங்குகின்றேன்.

**விஜித் கணுகல**
கலாசார அலுவல்கள் பணிப்பாளர்.
2012.02.26 ஆம் திகதி.



## ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ සභාපතිතුමාගේ පණිවිඩය

මානව ඉතිහාසයේ ආරම්භක යුගයේ සිටම නර්තනය හෙවත් නැටීම මිනිස් සමාජය තුළ යම්කිසි මට්ටමකින් පැවැති බව විශ්වාස කෙරේ. වෙසෙසින් ම ආදීම යුගවල ඉතා අපහසුවෙන් දඩයමක් සොයාගත් විට ඇතිවන තෘප්තිමත් බව සතුට අන්‍යයන්ට පෙන්වීමට හා සමාජශීලි සත්ත්වයකු වශයෙන් ඒ අත්දැකීම මෙන්ම දඩයම බෙදාහදා ගැනීමට සරල නර්තන සේ ගිණිය හැකි අංග චලන මිනිසා විසින් ඉදිරිපත් කර තිබේ. ඉතා පැරණි යුගවලට අයත් ලෙන් ගුහාවල සතුන්ගේ ලේවලින් ම කුරුටු ගෑ අතීත සටහන් ඊට දෙස් දෙයි. මෙරට ආදිවාසීන්ගේ නර්තන ද වර්තමාන සාක්ෂියකි. මිනිසා සිය සාමාන්‍ය ඉරියව්, අතපය හැසිරවීම් යම් රටාවකට, පිළිවෙළකට, රිද්මයකට කිරීමට ක්‍රමයෙන් පුරුදු පුහුණු විය. අන් සෑම කලාවකට ම ප්‍රථමයෙන් මේ අංග චලන ඔස්සේ සැකසුණු නර්තනය බිහි වූ අතර වර්තමානය වන විට ශ්‍රී ලාංකික අපට ඉතා දියුණු සංස්කෘතික හරයකින් සහ සෞන්දර්යයකින් හෙබි නර්තන සම්ප්‍රදායක් හිමි වී තිබේ.

අනෙකුත් කලාවන්ට සාපේක්ෂව නර්තන කලාව මගින් මිනිසාගේ ප්‍රීතිය, දුක, ආවේගය වැනි සංවේදනා ප්‍රකාශ කිරීමේ ගුණය ඉහළ මට්ටමක පවතින බව පිළිගැනිමයි. නර්තනය යනු එක්තරා භාෂාවක් ලෙස සැලකුවද වචන භාවිත නොකොට සිය භාවාත්මක හැඟීම් ප්‍රකාශ කිරීමේ ගුණය නර්තන කලාව සතු වේ.

මෙවැනි උතුම් කලාවක් පෝෂණය කිරීමේ ලා වෙහෙස මහන්සි වී කටයුතු කරන කලාකරුවන් උදෙසා සම්මාන ප්‍රදානය කරන රාජ්‍ය නර්තන සම්මාන උළෙල, රාජ්‍ය නර්තන අනුමණ්ඩලයේ එක් ව්‍යාපෘතියක ප්‍රතිඵලයකි. මෙරට දේශීය නර්තන කලාව පෝෂණය කිරීමේ ලා උපදේශන සේවා සැපයීම හා ඒ සඳහා කටයුතු කිරීම උදෙසා ශ්‍රී ලංකා කලා මණ්ඩලය විසින් පත් කර ඇති රාජ්‍ය නර්තන අනුමණ්ඩලය මෙම යුග මෙහෙවර ඉටු කිරීම සඳහා කැප වී ක්‍රියා කරන බව මාගේ විශ්වාසයයි.

සිය දක්ෂතා පෙන්වමින් රාජ්‍ය නර්තන උළෙලේ තරගාවලීන් සඳහා සහභාගී වූ සියලුම කණ්ඩායම්වලට ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ ශුභාශිංසන පිරිනමමි. සිය දක්ෂතා පෙන්වා ඒ උදෙසා වාර්ෂිකව ඇගයීම් ලබන මෙම රාජ්‍ය නර්තන උළෙල ඔවුන්ගේ ම උළෙලක් වනු දැක්ම මාගේ පැතුමයි.

දේශීය නර්තන කලාවේ පුනරුදය සඳහා කැපවී කටයුතු කරන රාජ්‍ය නර්තන අනුමණ්ඩලයටත් මෙම අරමුණ සාර්ථක කර ගැනීම සඳහා දායකත්වය සපයන සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවටත් ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ ස්තුතිය ප්‍රකාශ කිරීමට ද මෙය අවස්ථාව කර ගනිමි.

2011 රාජ්‍ය නර්තන උළෙලේ සම්මාන ප්‍රදානෝත්සවය සර්වප්‍රකාරයෙන් ම සාර්ථක වේවා !

**මහාචාර්ය කාලෝ ෆොන්සේකා**
සභාපති
ශ්‍රී ලංකා කලා මණ්ඩලය.
2012 පෙබරවාරි මස 26 වැනි දින දීය.



# இலங்கை கலைக் கழகத் தலைவரின் செய்தி

மானிட வரலாற்றின் ஆரம்பத்தில் இருந்தே நடனம் இல்லையெனில் ஆடல் மனித சமுதாயத்தின் ஏதோ ஒரு அளவு நிலவி இருந்திருப்பதாக நம்பப்படுகின்றது. முக்கியமாகவே ஆரம்ப கால கட்டங்களின் போது விலங்குகளை வேட்டை ஆடிய போது ஏற்படும் திருப்தியை. மகிழச்சியை ஏனையோருக்கு காட்டுவதற்கு மற்றும் ஒரு சமூக விலங்கென்ற வகையில் வேட்டையை மற்றும் இதனால் பெற்ற அனுபவங்களை பகிர்ந்துகொள்வதற்கு எளிதான நடனமாக கருதக்கூடிய உடல் அசைவுகளை மனிதனால் முன்வைக்கப்பட்டுள்ளது. மிகப் புராதன காலகட்டங்களை சார்ந்த கற் குகைகளில் விலங்குகளின் இரத்தத்தால் கீறப்பட்டுள்ள குறிப்புகள் இதற்கான சாட்சிகளை அளிக்கின்றது. இந் நாட்டு ஆதிவாசிகளின் நடனமும் ஒரு நிகழ்காலத்து சாட்சியாகவே இருக்கின்றது. மனிதன் தமது பொதுவான உடல் அமர்வு நிலைகள், கால் கைகள் போன்ற உடல் உறுப்புகளை ஒரு விதமாக அசைத்தல், முறையாகவும் சந்தமாகவும் செய்வதற்கு படிப்படியாகக் கற்றனர். ஏனைய அனைத்து கலைகளுக்கு முன்பு இவ் உடல் அசைவுகள் ஊடாக அமைந்த நடனங்கள் உருவாகியதோடு நிகழ்காலத்தின் போது இலங்கையர்களான எமக்கு மிக முன்னேற்றமான கலாசார ரீதியில் பொருளுடனான மற்றும் சௌந்தரியமான நடன பாரம்பரியமொன்று எமக்கு வாய்க்கப்பட்டுள்ளது.

ஏனைய கலைகளுக்கு ஒப்பாக நடன கலையினால் மனிதனின் மகிழ்வு, துக்கம், உணர்வுகள் போன்ற மனப்பாங்குகளை வெளிப்படுத்துகின்ற தன்மை ஆக உயாதர மட்டத்தில் உள்ளதாக ஏற்றுக்கொள்ளப்பட்டுள்ளது. நடனம் என்பதை ஒரு மொழியாக எண்ணப்பட்டாலும் சொற்களை உபயோகிக்காமல் தமது உணர்ச்சிபூர்வமான எண்ணங்களை வெளிப்படுத்தும் சக்தி நடன கலையில் உட்பட்டுள்ளது.

இத்தகைய ஒரு சிறந்த கலையை வளர்ப்பதற்கு பெரும் பாடுடன் செயற்படுகின்ற கலைஞர்களுக்கு விருதுகள் வழங்ககின்ற அரச நடன விருதுகள் வழங்கும் விழா, அரச நடன சபைசார் ஒரு கருத்திட்டத்தின் பலனாகும். இந்நாட்டு நடன கலையை வளர்ப்பதற்காக ஆலோசனை சேவைகளை அளித்தல் மற்றும் அதற்காக செயற்படுவதைப் பொருட்டு இலங்கை கலைக் கழகத்தால் நியமிக்கப்பட்டுள்ள அரச நடன சபை இக் காலத்திற்குரிய பணியை நிறைவேற்றுவதற்காக அர்ப்பணிப்புடன் செயற்படுவதென்பது எனது நம்பிக்கையாகும்.

சுய திறமைகளை தோற்றி அரச நடன விழாசார்ந்த போட்டித் தொடர்களில் பங்கேற்றிய அனைத்து குழக்களுக்கு இலங்கை கலை கழகத்தின் நல்வாழத்துகளை வழங்குகின்றேன். தமது திறமைகளை காட்டப்பட்டு அதனை பொருட்டு வருடாந்த மதிப்பீடுகளை பெறுகின்ற இவ் அரச நடன விழா நடன கலைஞர்களின் விழாவாகவே அமைந்திருப்பதை காண்பதே எனது பிரர்த்தனை.

உள்நாட்டு நடன கலையின் மறுமலர்ச்சிக்காக அர்ப்பணிப்புடன் செயற்படுகின்ற அரச நடன சபைக்கும் இந் நோக்கத்தை சிறப்பூட்டிக் கொள்வதற்கு துணையளிக்கின்ற கலாசார அலுவல்கள் திணைக்களத்திற்கும் இலங்கை கலைக் கழகத்திற்கும் எனது நன்றியினை வழங்கிட இச் சந்தர்ப்பத்தை பயன்படுத்திக்கொள்கின்றேன்.

**பேராசிரியர். காலோ பொன்சேகா**
தலைவர்
இலங்கை கலைக் கழகம்
2012.02.26 ஆம் திகதி.



## රාජ්‍ය නර්තන හා මුද්‍රා නාට්‍ය අනුමණ්ඩලයේ සභාපතිතුමාගේ පණිවිඩය

අද අපි හෙළයේ මහා කලාගුරු පණිභාරතයන් සමරමින් දේශීය නර්තන කලාවේ සාම්ප්‍රදායික ස්වරූපය ආරක්ෂා කිරීමට වෙහෙසෙන්නා වූ කලාකරුවන්ට සම්මාන පුදන්නෙමු. බොහෝ දෙනා නිර්මාණාත්මක නර්තන කලාවක් හෝ ප්‍රාසාංගික කලාවක් ගැන කතා කරමින් ඊට මුවාවී නැටුම විකෘති කරද්දී මේ අවංක නැටුම් ගුරුවරු එයට එරෙහිව උඩුගම් බලා යමින් දේශීය සාම්ප්‍රදායික නැටුම රැකගනිති. ඔවුන්ට අපගේ ප්‍රණාමය !

බොහෝ කාලයක් තිස්සේ විවිධ ගුරුකුල යටතේ කේතකරණය වූ අපේ උඩරට, පහතරට හා සබරගමු නැටුම නූතන ප්‍රාසාංගික අවශ්‍යතාවයන්ට අනුව වඩාත් සියුම් ලෙස විශ්ලේෂණය විය යුතු යැයි මම සිතමි. ඒ සඳහා අපේ නැටුමට මූලග්‍රන්ථයක් තිබීම වැදගත් වේ. භරත මුනිවරයාගේ "නාට්‍ය ශාස්ත්‍රය" ආසියානු නර්තනයේ සියලු ලක්ෂණ ආවරණය කරනු නමුදු, අපේ නැටුමේ සුවිශේෂ ලක්ෂණ මත පදනම් වූ ශාස්ත්‍රීය මූලාශ්‍රයන් නිර්මාණය විය යුතුය. (කථකලි නැටුමේ මුද්‍රා භාවිතය සම්බන්ධව කේරළයේ නර්තන ශිල්පීන් අනුගමනය කරන්නේ නාට්‍යය ශාස්ත්‍රයේ රීතින් නොව හස්ත ලක්ෂණ දීපිකා නම් මලයාලි ග්‍රන්ථය යි.) අපි නාට්‍යය ශාස්ත්‍රයම අනුගමනය කළ යුතුද? සිංහල නැටුමට විශේෂිත මූලග්‍රන්ථයක් අපට නිර්මාණය කරගත නොහැකිද? මේවා පිළිබඳව වඩාත් ගැඹුරින් සිතීමට දැන් කාලය යි.

නර්තන අනුමණ්ඩලය ලෙස අපගේ කාර්යභාරය මෙවැනි කටයුතු කෙරෙහි ශිල්පීන් හා විද්වතුන් යොමුකිරීමත්, ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සලසාදීමත් ය.

එම කාර්යයන්හි දී අප හා සුහදව අත්වැල් බැඳගන්නා සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විජිත් කණුගල මහතා ඇතුලු සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවත්, ගරු සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමන්, එම අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ සභාපතිතුමන් ඇතුලු විධායක සභාව මෙහිදී ගෞරවයෙන් සිහිපත් කරමි.

අද "නර්තන තිලක" සම්මානයෙන් බුහුමන් ලබන කලාසූරී පියසාර ශිල්පාධිපති ගුරුතුමන්ටත් 2011 රාජ්‍ය නර්තන උළෙලේ සියලු ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ටත් මම ශුභාශිංසනය කරමි.

### රවිබන්ධු විද්‍යාපති

සභාපති
රාජ්‍ය නර්තන හා මුද්‍රා නාට්‍ය අනුමණ්ඩලය
2012 පෙබරවාරි මස 26 වැනි දින දීය

2011 වසරේ නර්තන තිලක සම්මානයෙන් පිදුම් ලබන

## හෙළ කලා කෙත - මහ වනස්පති

# පියසාර ශිල්පාධිපති



වර්ෂ 1945 ක් වූ මාර්තු මස 19 වැනි දින ඓතිහාසික ඇතුගල් පුරවරයේ පොල්ගහවෙල ප්‍රදේශයේ දී ජන්ම ලාභයලත් පියසාර ශිල්පාධිපති නම් වූ අප කථානායකයාණෝ මූලික අධ්‍යාපනය ලැබූයේ පොල්ගහවෙල ශාන්ත බර්නාදෙත් විද්‍යාලයෙනි.

ජන්ම දායාදයක් වශයෙන් උරුම කර ගෙන ආ නර්තන කලා විෂයයන් කෙරෙහි සුවිශේෂී දක්ෂතා විශද කළ පියසාරයන් ශිල්පා ගුරුතුමා සහ සයිමන් ගුරුතුමා වෙතින් උඩරට නර්තනය හා බෙර වාදනය මැනවින් ප්‍රගුණ කළේය.

ප්‍රතිභාපූර්ණ පාරම්පරික නර්තන ශිල්පී පරම්පරාවකට උරුමකම් කියන හෙතෙම පාසල් අධ්‍යාපන කටයුතු හමාර වීමත් සමඟ 1965 වසරේ එවකට මෙරට සුප්‍රසිද්ධ චිත්‍රසේන - වජිරා කලායතනයේ ශිල්පියකු වශයෙන් සම්බන්ධ විය. කෙටි කලකින්ම එම කලායතනයට ගුරුවරයකු වශයෙන් ස්වකීය දායකත්වය ලබා දුන් ඒ මහතා මේ දක්වාම එහි නර්තන උපදේශකවරයකු වශයෙන් කටයුතු කරයි.

අනතුරුව රජයේ නැටුම් හා මුද්‍රානාට්‍ය විද්‍යාලයට (හේවුඩ්) ඇතුළත්ව නර්තන විෂය පිළිබඳව ඩිප්ලෝමාවක් හිමිකරගත් හෙතෙම තබ්ලා වාදනය පිළිබඳ භාත්කණ්ඩ විශ්වවිද්‍යාලයේ පළමු පෙළ ඩිප්ලෝමාධාරියකු ද වේ.

පියසාරයන්ගේ සමස්ත කලා මෙහෙවර ප්‍රධාන ධාරාවන් කිහිපයක් ඔස්සේ ගොනු කළ හැකිය.

* කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපය, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය ඇතුළු උසස් අධ්‍යාපන ආයතන ගණනාවක ආචාර්යවරයකු වශයෙන් කටයුතු කිරීම.
* විදේශීය විශ්වවිද්‍යාල ගණනාවක නර්තන හා බෙරවාදන ශිල්පය පිළිබඳ ඉගැන්වූ ප්‍රථම ශ්‍රී ලාංකේය නර්තන ගුරුවරයා වීම.

බ්‍රිතාන්‍ය

i ලන්ඩන් විශ්වවිද්‍යාලයේ රාජකීය සංගීත ඇකඩමිය

ii ගිල්හෝල් සංගීත විද්‍යාලය

iii ලන්ඩන් නව නර්තන පාසල

ඇමෙරිකාව

i ලොස් ඇන්ජලීස් විශ්වවිද්‍යාලය

ii ශාන්ත බාබරා විශ්වවිද්‍යාලය

iii කැලිෆෝනියා ලලිත කලා විශ්වවිද්‍යාලය

නවසීලන්තය

i කැන්ටබරි විශ්වවිද්‍යාලය

කැනඩාව

i ඔටාවා විශ්වවිද්‍යාලය



* දේශීය බෙර වාදන කලාවට "ගැවුල" නමින් බෙරයක් නිර්මාණය කර, ඊට ගැලපෙන සරඹ සහ විවිධ තාලවලට ගැලපෙන ගැවුල් වාදන නිර්මාණය කිරීම.
* ලන්ඩන් රාජකීය විද්‍යාලයේ මහාචාර්ය "කෙවින් හැත්වේ" මහතා සමඟ රෝයල් ෆෙස්ටිවල් ශාලාවේ ස්නෙයා ඩ්‍රම් සහ තම්මැට්ටම් යුගල වාදනයක් ඉදිරිපත් කිරීමත්, අමෙරිකාවේ කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ස්කොට් මාකස් මහතා සමඟ බටහිර බෙර සමඟ ශ්‍රී ලාංකේය බෙර යුගල වාදනයක් ඉදිරිපත් කිරීමත්, නිර්මාණාත්මක යුගල, ඒකල හා සමූහ වාදන ඉදිරිපත් කර ජාත්‍යන්තර කීර්තියට පත්වීම.
* 1970 දශකයේ සිට මේ දක්වාම රාජ්‍ය නර්තන හා මුද්‍රා නාට්‍ය අනුමණ්ඩලයේ ක්‍රියාකාරී සාමාජිකයකු වශයෙන් කටයුතු කිරීම.
* මීට දශක තුනකට පමණ පෙර පියසාර ශිල්පාධිපති මහතා සහ එතුමාගේ බිරිඳ කාන්ති ශිල්පාධිපති මහත්මිය විසින් ආරම්භ කර මේ දක්වාම පවත්වාගෙන යනු ලබන "පියසාර - කාන්ති" රංගායතනය මඟින් සුවහසක් අංකුර කලා ශිල්පීන්ගේ නර්තන කලා හැකියාවන් ඔපවත් කිරීමට මහත් කැපවීමෙන් කටයුතු කිරීම.

ශ්‍රී ලාංකේය නර්තන කලා ඉතිහාසයේ යුගයක් වර්ණවත් කරමින්, එකී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් නව නිර්මාණ හඳුන්වා දෙමින් ද, ඒ ඔස්සේ නර්තනාභිලාෂී දෙස් විදෙස් සිසු දරු දැරියන් නිර්මාණශීලි සොඳුරු මිනිසුන් බවට පත් කිරීමට ඇප කැප වෙමින් ද, අපගේ ජාතික උරුමයක් වූ නර්තන කලාව ඔස්සේ ශ්‍රී ලාංකේය ලකුණ ජාත්‍යන්තරව සනිටුහන් කරමින් ද ඉටු කරන ලද සුවිශිෂ්ට යුග මෙහෙවර වෙනුවෙන් පියසාර ශිල්පාධිපති නම් වූ ප්‍රතිභාපූර්ණ නර්තනවේදියාණෙනි, ඔබ නර්තන තිලක සම්මානයෙන් පිදුම් ලබන වගයි.

# රාජ්‍ය නර්තන උළෙල - ගමන් මග

## 2011 නර්තන තරගාවලිය පිළිබඳ කෙටි හැඳින්වීමක්

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන්, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ රාජ්‍ය නර්තන හා මුද්‍රා නාට්‍ය අනුමණ්ඩලය මගින් පවත්වනු ලබන රාජ්‍ය නර්තන උළෙල සංවිධානය පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි වේ.

## තරග චක්‍රලේඛනය

2011 වර්ෂයේ පැවැති රාජ්‍ය නර්තන හා මුද්‍රා නාට්‍ය අනුමණ්ඩලයේ විෂයාත්මක උපදෙස් පදනම් කරගෙන සංස්කෘතික අධ්‍යක්ෂ විසින් එම වර්ෂයේ මාර්තු 22 වැනි දින සිංහල හා දමිළ තරග චක්‍රලේඛනය නිකුත් කරන ලදී. තරග චක්‍රලේඛන දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිකුත් කළ අතර තරගාවලිය පිළිබඳ සිළුමිණ, දිනමිණ, තිනකරන් හා වීරකේසරි පුවත්පත්වල දැන්වීම් ද පළ කරන ලදී.

## නර්තන උළෙල සංවිධානය කිරීමේ අරමුණු

1. දිවයින පුරා විසිරී සිටින නර්තන ශිල්පීන්ට තමන්ගේ දක්ෂතාවන් එළි දැක්වීමට අවස්ථාව සැලසීම.
2. නර්තන ශිල්පීන්ගේ දක්ෂතාවන් ඇගයීම.
3. නර්තන කලාවන් පිළිබඳ ප්‍රාසාංගික අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාවක් සැලසීම.
4. පරිහානියට පත්වීගෙන යන සාම්ප්‍රදායික නර්තනාංග ප්‍රවර්ධනය හා සංරක්ෂණය කිරීම.

මුළු දිවයිනම ආවරණය වන පරිදි උඩරට, පහතරට, සබරගමු, ජන නැටුම්, සමූහ බෙර වාදනය හා භරත නාට්‍යම් යන නර්තන ක්ෂේත්‍ර පදනම් කරගෙන පවත්වන ලද අතර මේ සඳහා ලංකාව පුරා විසිරී සිටින සිංහල දෙමළ සියලුම නර්තන ශිල්පීන්ට සහභාගී වීමට අවස්ථාව සලසා තිබුණි.

## තරග ශීර්ෂ

උඩරට නැටුම් සම්ප්‍රදාය

ළමා අංශය (වයස අවු. 8-15 අතර)

අසදෘස වන්නම, එලවැල ආනය, කොහොඹා හැල්ල

### පහතරට නැටුම් සම්ප්‍රදාය

දෙතාලය, සියපදය, නඩන්දුව ඇසුරින් නිර්මාණය, බලිකඩතුරා කවි, තෙල්මේ

### සබරගමු නැටුම් සම්ප්‍රදාය

චාමර පාළිය, අඟුරු දුම්මල පාළිය, අත්මිණ උපත

### උඩරට නැටුම් සම්ප්‍රදාය

ජ්‍යෙෂ්ට අංශය (වයස අවු. 15-29 අතර)

සිංහ වල්ලි, බලි, පන්තේරු

### පහතරට නැටුම් සම්ප්‍රදාය

නාග කන්‍යා, පන්දම් පාළිය, දුම්මල පදය

### සබරගමු නැටුම් සම්ප්‍රදාය

සළු පාළිය, දේව කෝල පාඩුව, යහන් දැක්ම

### විවෘත අංශය

නව වන්නම් නිර්මාණ, සමූහ බෙර වාදනය

## තරග පැවැත්වීමේ රටාව

මේ සඳහා අදාළ වයස් කාණ්ඩ අනුව දිවයිනේ ඕනෑම කණ්ඩායමකට සහභාගි විය හැකිය. සංස්කෘතික මධ්‍යස්ථාන, පාසල්, කලා සංගම් හා කලායතන මේ ශීර්ෂයන්හි තරග සඳහා සහභාගි විය.

## පළමු වටයේ තරඟ පැවැත්වීම

| දිස්ත්‍රික්කය | ඉදිරිපත් වූ කණ්ඩායම සංඛ්‍යාව | තරඟ පැවැත්වෙන දිනයන් | තරඟ පැවැත්වූ ස්ථාන |
|---|---|---|---|
| පුත්තලම | 15 | 2011.09.10 | සර්වෝදය ප්‍රජා මධ්‍යස්ථානය |
| ගම්පහ | 12 | 2011.09.07 | ඇඹරළුව සංස්කෘතික මධ්‍යස්ථානය |
| කොළඹ | 10 | 2011.09.15 | ජෝන්ද සිල්වා සමරු රඟහල |
| කළුතර | 50 | 201109.17 | ශාන්ත ජෝන් විද්‍යාලය |
| කෑගල්ල | 08 | 2011.09.11 | කෑගල්ල සංස්කෘතික මධ්‍යස්ථානය |
| කුරුණෑගල | 15 | 2011.08.16 | කුරුණෑගල සහිරා විද්‍යාලය |
| රත්නපුර | 48 | 2011.08.19 | ර/ගැටන්ගම රාජකීය විද්‍යාලය |
| මාතලේ | 15 | 2011.08.23 | මාතලේ සංස්කෘතික මධ්‍යස්ථානය |
| මහනුවර | 25 | 2011.08.22 | අස්ගිරිය චන්ද්‍රජෝති බෞද්ධ විද්‍යාලය |
| නුවරඑළිය | 10 | 2011.08.24 | අස්ගිරිය චන්ද්‍රජෝති බෞද්ධ විද්‍යාලය |
| මාතර | 12 | 2011.09.25 | නූපේ සංස්කෘතික මධ්‍යස්ථානය |
| හම්බන්තොට | 14 | 2011.09.06 | රන්න සංස්කෘතික මධ්‍යස්ථානය |
| ගාල්ල | 16 | 2011.09.02 | කලුවැල්ල බෞද්ධ මධ්‍යස්ථානය |
| පොළොන්නරුව | 10 | 2011.09.08 | ධවල මන්දිරය |
| අනුරාධපුර | 30 | 2011.09.09 | ශ්‍රී සම්බුද්ධ ජයන්ති විහාරය |
| බදුල්ල | 08 | 2011.09.17 | බ/ධර්මාශෝක ම.ම.වි |
| මොනරාගල | 10 | 2011.09.18 | වැලියාය සිරි පියරතන පිරිවෙන |
| වව්නියාව | 18 | 2011.11.03 | ව/වෙල්ලිකුලම් ම.වි. |
| යාපනය | 20 | 2011.11.05 | යා/වෙම්බඩි කාන්තා විද්‍යාලය |
| ත්‍රිකුණාමලය | 20 | 2011.12.05 | ත්‍රි/විග්නේෂ්වරා ම.වි. |

## පළමු වටයේ විනිශ්චය මණ්ඩලය

1. පියසාර ශිල්පාධිපති මහතා
2. ආචාර්ය ශ්‍රියාණි රාජපක්ෂ මහත්මිය
3. මහාචාර්ය ලයනල් බෙන්තරගේ මහතා
4. රවිබන්ධු විද්‍යාපති මහතා
5. සේනාරත්න පතිරණ මහතා
6. සුමතිපාල ශිල්පාධිපති මහතා
7. වික්‍රමසිංහ බණ්ඩා මහතා
8. ඥාණසිරි පීරිස් මහතා
9. මහින්ද විමලසිරි මහතා
10. ගයානි දීපිකා මද්දුමගේ මහත්මිය
11. තිලක්ෂි ද අල්විස් මහත්මිය
12. සිරිපාල ඕවිටගෙදර මහතා
13. පාලිකා සමන්ති මහත්මිය
14. සුනිලා රූපස්සර මහත්මිය
15. අචිර තෙන්නකෝන් මහතා
16. හේරත් බණ්ඩා මහතා
17. කරුණාරත්න පොඩිබණ්ඩාර මහතා
18. නිහාල් චන්ද්‍රසිරි මහතා
19. ධම්මිකා ලංකාතිලක මහත්මිය
20. සේන එළමල්දෙනිය මහතා

## අවසන් වටයේ තරග පැවැත්වීම - සිංහල මාධ්‍ය

2011.11.19 සහ 20 යන දිනයන් හිදී ජොන් ද සිල්වා සමරු රඟහලේ දී පවත්වන ලද අතර රාජ්‍ය නර්තන උළෙලෙහි (සිංහල මාධ්‍ය) අවසන් වටයේ තරග සඳහා සහභාගි වූ නර්තන කණ්ඩායම් අයත් දිස්ත්‍රික්ක

බදුල්ල, නුවරඑළිය, මාතලේ, මහනුවර, රත්නපුර, කෑගල්ල, පොළොන්නරුව, අනුරාධපුරය, හම්බන්තොට, මාතර, ගාල්ල, කොළඹ, කළුතර, ගම්පහ

## සම්ප්‍රදායන් වශයෙන් තරග සඳහා සහභාගී වූ කණ්ඩායම් සංඛ්‍යාව

1. උඩරට නැටුම් සම්ප්‍රදාය - තරග ශීර්ෂ 48
2. පහතරට නැටුම් සම්ප්‍රදාය - තරග ශීර්ෂ 20
3. සබරගමු නැටුම් සම්ප්‍රදාය - තරග ශීර්ෂ 14
4. නව වන්නම් නිර්මාණ - තරග ශීර්ෂ 09
5. සමූහ බෙර වාදන - තරග ශීර්ෂ 06

සහභාගි වූ නර්තන ශිල්පීන් සංඛ්‍යාව 1800ට ආසන්න වේ.

## අවසන් වටයේ විනිශ්චය මණ්ඩලය - සිංහල මාධ්‍ය

1. කලාසූරි පියසාර ශිල්පාධිපති මහතා
2. රවිබන්ධු විද්‍යාපති මහතා
3. ආචාර්ය වෛද්‍යවතී රාජපක්ෂ මෙය
4. මහින්ද විමලසිරි මහතා
5. ඊවා සිල්වා මහත්මිය
6. මහාචාර්ය ලයනල් බෙන්තරගේ මහතා
7. පාලිකා සමන්ති මහත්මිය
8. නිලක්ෂි ද අල්විස් මහත්මිය
9. වික්‍රමසිංහ බණ්ඩාර මහතා
10. ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය
11. ගයානි දීපිකා මද්දුමගේ මහත්මිය
12. ජනනාත් වරකාගොඩ මහතා

## අවසන් වටයේ තරග පැවැත්වීම - දමිළ මාධ්‍ය

2011 රාජ්‍ය නර්තන තරගාවලිය වෙනුවෙන් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව නර්තන තරග වට 03 ක් ඔස්සේ පැවැත්වීමට තීරණය කර තිබුණ ද තරග සංවිධානය හා ඒ සඳහා ඉදිරිපත් වන ශිල්පී ශිල්පිණියන්ගේ පහසුව සහ ඉදිරිපත්වී ඇති නර්තන කණ්ඩායම් ප්‍රමාණය සැලකීමට ගෙන දෙවන වටය අවසන් වටය සේ සලකා තරග පැවැත්වීමට තීරණය කරන ලදී.

**01. දිනය :**

2012 ජනවාරි මස 22 වැනි දින

**02. ස්ථානය :**

වවුනියාව රම්බෙයිකුලම් කාන්තා විද්‍යාලය

වැඩිම නර්තන කණ්ඩායම් සංඛ්‍යාවක් ඉදිරිපත් වූයේ යාපනය, වවුනියාව, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවලිනි. එබැවින් වව්නියාවේ දී තරග පැවැත්වීමට සුදුසු යයි යෝජනා කරන ලදී.

**03. කණ්ඩායම් සහභාගිත්වය**

| දිස්ත්‍රික්කය | කණ්ඩායම් සංඛ්‍යාව |
|---|---|
| යාපනය | 15 |
| වවුනියාව | 15 |
| ත්‍රිකුණාමලය | 08 |
| රත්නපුර | 02 |

**04. විනිශ්චය මණ්ඩලය**

නර්තන හා මුද්‍රා නාට්‍ය අනුමණ්ඩලයේ නිර්දේශය අනුව විනිශ්චය මණ්ඩලය පත් කරන ලදී.

i ප්‍රවීණ නර්තනවේදී ලීලාම්බිගෙයි සෙල්වරාජා මහත්මිය
ii නර්තන ශිල්පී ශිවානන්දි හරිදර්ශන් මහත්මිය
iii නර්තන ශිල්පී භවානි රඝුප්‍රියා මහත්මිය

## தமிழ் மொழி மூல முதலாவது சுற்று நடுவர்கள்

1. திருமதி பாரதி சிவகாந்தன்
2. திருமதி சுமதி புவேந்திரன்
3. திருமதி ரி. விமலச்சந்திரன்
4. திருமதி சுபாஷினி சர்வேஸ்வரன்
5. திருமதி வாசுகி முகுந்தன்
6. திருமதி ஜீவா இரட்ணராஜா

## இறுதிச் சுற்று போட்டிகள்

கலாசார அலுவல்கள் திணைக்களம் மற்றும் அரச நடன மற்றும் நாட்டிய நாடகக் குழு ஒன்றினைந்து ஏற்பாடு செய்த 2011 அரச நடன போட்டிகள் சுற்று நிருபத்திற்கு அமைய நடன போட்டிகள் 03 சுற்றுகளாக நடாத்தப்பட்டது.

நடன ஏற்பாட்டளர்கள் மற்றும் நடன போட்டியாளர்களின் வசதிக்கேற்ப இரண்டாவது சுற்றுப்போட்டிகளின் பின் இறுதிச் சுற்றுபோட்டிகள் நடாத்துவதற்கு தீர்மானிக்கப்பட்டது.

01. திகதி — 2012 ஜனவரி மாதம் 22

02 இடம் — வவுனியா இறம்பைக்குளம் மகளிர் வித்தியாலயம்

அதிகமான போட்டியாளர்கள் இடம்பெறுவது யாழ்ப்பாணம், வவுனியா மற்றும் திருகோணமலை மாவட்டங்களைச் சேர்ந்தவர்களாதலால் இறுதிச் சுற்றுப்போட்டிகளை வவுனியாவில் நடத்துவதற்கு தீர்மானிக்கப்பட்டது.

03 — குழுக்களின் பங்குபற்றல்

| மாவட்டம் | குழுக்களின் எண்ணிக்கை |
|---|---|
| யாழ்ப்பாணம் | 15 |
| வவுனியா | 15 |
| திருகோணமலை | 08 |
| இரத்தினபுரி | 02 |

04 — இறுதிச் சுற்று நடுவர்கள் குழு

அரச நடனம் மற்றும் நாட்டிய நாடக குழுவின் தீர்மானத்திற்கமைய மேற்படி நடுவர்கள் தெரிவு செய்யப்பட்டார்கள்.

1. திருமதி லீலாம்பிகை செல்வராசா
2. திருமதி சிவானந்தி ஹரிதர்சன்
3. திருமதி பவானி ரகுப்பிரியா

சிறுவர் மற்றும் சிரேஷ்ட, கனிஷ்ட பிரிவினரின் 12 நடனப்பிரிவுகளில் 58 விண்ணப்பங்கள் கிடைக்கப்பெற்றன.

1. சம்பிரதாய பரத நடனம்
2. தமிழ் கிராமிய நடனம்
3. பரத நடன பிரிவில் நவீன நடனம்

ஆகியவற்றில் சுற்று நிருபத்திற்கமைய இறுதிப்போட்டி முடிவுகளின் படி

08 முதலாமிடங்களும்
04 இரண்டாமிடங்களும்
01 மூன்றாமிடமும்
கிடைக்கப்பெற்றன.

முதலாமிடத்திற்கு விருது, பணப்பரிசு, சான்றிதழ்களும் வழங்கப்படும்.

## රාජ්‍ය නර්තන උළෙල 2011 - ජයග්‍රාහී නාම ලේඛනය

ප්‍රථම ස්ථාන

උඩරට නැටුම් සම්පදාය

1. අසදෘස වන්නම - පුෂ්පදාන බාලිකා විද්‍යාලය - මහනුවර (විදුහල්පති)
2. එලවැලදානය - තුරු ජයසක් රංගායතනය - කුරුණෑගල (පී.එම්. ලලිත් ප්‍රසන්න කුමාර)
3. කොහොඹා හැල්ල - තමරි දර්ශී රංගායතනය - ගම්පහ (ටී.කේ. තමරි දර්ශී ජයසේන)
4. සිංහවල්ලි කතාව - සව්සිරි නර්තන අසපුව - ගම්පහ (සී.එස්. කුමාරසිරි)
5. බලි - ශ්‍රී ලංකා දේශීය කලායතනය - මහනුවර (ජී.එම්.ජී. තිලිණි ජයවීර)
6. පංතේරු - අමරසූරිය විද්‍යාලය - ගාල්ල (විදුහල්පති)

පහතරට නැටුම් සම්ප්‍රදාය

1. මාත්‍රා පහේ නිර්මාණය - කරුණාදාස ඔලබොඩුව රංගායතනය - කළුතර (කරුණාදාස ඔලබොඩුව)
2. තෙල්මේ - ප්‍රියශාන්ත රංගායතනය - ගම්පහ (එච්.ඒ. බුද්ධික)
3. බලිකඩතුරා කවි - සූර්ය දීප කලායතනය - මාතර (එස්.ඒ. ප්‍රදීපිකා සුරේන්ද්‍ර)
4. නාග කන්‍යා - සුමනබාලිකා විද්‍යාලය - රත්නපුර (ඩී.එල්. ජගත් චන්ද්‍රලාල්)
5. පන්දම් පාළිය - පහත රට රංගන කලායතනය - කළුතර (කේ.ඩී.ආර්. ප්‍රනාන්දු)
6. දුම්මල පදය - ශ්‍රී සංඝ ප්‍රදීප කලායතනය - කළුතර (යූ.ඩී. මහේෂි ප්‍රියංක)

සබරගමු නැටුම් සම්ප්‍රදාය

1. චාමර පාළිය - සුමන බාලිකා විද්‍යාලය - රත්නපුර (ඩී.එල්. ජගත් චන්ද්‍රලාල්)
2. අත්මිණි උපත - බස්නාහිර කලාකෙත, හොරණ. (කේ.ඒ. මල්ලිකා කුලසූරිය)
3. අඟුරු දුම්මල පාළිය - කලාප අධ්‍යාපන කාර්යාලය - හොරණ (කේ.ඒ. මල්ලිකා කුලසූරිය)
4. සළු පාළිය - ජනරංජන කලායතනය - කළුතර (ආර්.ඒ.පී. ජානකී)
5. දේව කොල් පාඩුව - ශාස්ත්‍රෝදය කලායතනය - රත්නපුර (ඩී.වී.සී. අබේවර්ධන)
6. යහන් දැක්ම - රසාරා නර්තන නිකේතනය - කොළඹ (කේ.ඒ. මල්ලිකා කුලසූරිය)

නිර්මාණ

1. සමූහ බෙර වාදනය - ශ්‍රී ධර්ම විජය කලායතනය - කළුතර (එම්. නිලූෂා සංජීවනී)
2. නව වන්නම් නිර්මාණ - ශ්‍රී ලංකා නෘත්‍ය ජන කලා මණ්ඩලය - මහනුවර (ඊ.එම්. අරුණ ප්‍රදීප්)

ද්‍රවිඩ නැටුම්

1. ජන නැටුම් (ද්‍රවිඩ) - අභිනය භාරත් කලායතනය - රත්නපුර
2. නව නිර්මාණාත්මක නැටුම (ද්‍රවිඩ) - අභිනය භාරත් කලායතනය - රත්නපුර

# ප්‍රථම ස්ථාන

## උඩරට නැටුම් සම්ප්‍රදාය



බලි - ශ්‍රී ලංකා දේශීය කලායතනය - මහනුවර



සිංහවල්ලි කතාව - සව්සිරි නර්තන අසපුව - ගම්පහ



කොහොඹා හැල්ල - තමරි දර්ශී රංගායතනය - ගම්පහ



පංතේරු - අමරසූරිය විද්‍යාලය - ගාල්ල

# ප්‍රථම ස්ථාන

## පහතරට නැටුම් සම්ප්‍රදාය



දුම්මල පදය - ශ්‍රී සංඝ ප්‍රදීප කලායතනය - කළුතර



නාග කන්‍යා - සුමනබාලිකා විද්‍යාලය - රත්නපුර



තෙල්මේ - ප්‍රියශාන්ත රංගායතනය - ගම්පහ



මාත්‍රා පහේ නිර්මාණය - කරුණාදාස ඔලබොඩුව රංගායතනය - කළුතර

## ප්‍රථම ස්ථාන
## පහතරට නැටුම් සම්ප්‍රදාය



බලිකඩතුරා කවි - සූර්ය දීප කලායතනය - මාතර



පන්දම් පාළිය - පහත රට  රංගන කලායතනය - කළුතර

## ප්‍රථම ස්ථාන
## සබරගමු නැටුම් සම්ප්‍රදාය



සළු පාළිය - ජනරංජන කලායතනය - කළුතර



අත්මිණී උපත - බස්නාහිර කලාකෙත, හොරණ

## ප්‍රථම ස්ථාන
## සබරගමු නැටුම් සම්ප්‍රදාය




යහන් දැක්ම - රසාරා නර්තන නිකේතනය - කොළඹ




චාමර පාළිය - සුමන බාලිකා විද්‍යාලය - රත්නපුර

## ප්‍රථම ස්ථාන
## නිර්මාණ



නව වන්නම් නිර්මාණ - ශ්‍රී ලංකා නෘත්‍ය ජන කලා මණ්ඩලය - මහනුවර



සමූහ බෙර වාදනය - ශ්‍රී ධර්ම විජය කලායතනය - කළුතර (වාද්දූව)

# ප්‍රථම ස්ථාන
# ද්‍රවිඩ නැටුම්



ද්‍රවිඩ ජන නැටුම (චක්කෙයි කුම්මි) - අභිනය භාරත් කලායතනය
රත්නපුර



නව නිර්මාණාත්මක නැටුම (ද්‍රවිඩ) - අභිනය භාරත් කලායතනය
රත්නපුර

## நிருத்திய கீதாலயம் யாழ்ப்பாணம்

நெறியாள்கை — திருமதி அகல்யா இராஜபாரதி

1. திருமதி சுபாஷினி சிவானந்தன்
2. செல்வி சுகன்யா செல்வரெட்ணம்
3. செல்வி சரண்யா நிதர்ஷினி ஸ்ரீஸ்கந்தராஜா
4. செல்வி றொஷின்ரேகா தமிழரசன்
5. செல்வி சிந்துஜா ஏபிரகாம்
6. செல்வன் சுப்பிரமணியம் சுகுமார்

## தில்லானா

திரித்தில்லானா என்னும் தேசிய வகையினின்றும் உதித்ததே தில்லானாவாகும். உணர்ச்சியைத் தட்டி எழுபபவல்ல வகையில் அமைக்கப்பட்ட நாட்டிய, சங்கீத உருப்படி ஆகும். இது பல்லவி, அனுபல்லவி, சரணம் என்ற பகுதிகளைக் கொண்டு அமைக்கப்பட்ட உருப்படியாகும் விறுவிறுப்பான உருப்படி ஆகும். நாத்துருதீம், தனதிரனா திம், தத்தீம் தீம் போன்ற சொற்கட்டுக்களை மையமாகக் கொண்டு அமைக்கப்பட்டிருக்கும். நாட்டிய நிகழ்வில் இறுதி நிகழ்வாக கொள்ளப்படுகிறது. இவ்வுருப்படி 18ம் நூற்றாண்டில் எழுதப்பட்ட உருப்படியாகும்

## அபிநயசுரபி நடன மன்றம்

**சிரேஷ்ட பிரிவு பதம்**

நெறியாள்கை — திருமதி ஞானதர்ஷினி கிருபாகரன்

### பங்குபற்றும் மாணவிகள் பெயர்

செல்வி துஸேந்தினி கைலையந்கிரிநாதன்
செல்வி சுசீதா துரைரத்தினம்
செல்வி அபினயா நடராசா
செல்வி தாட்சாயினி தேவராசா
செல்வி றபேட்னா றேமன்டானியல்
செல்வி செல்வராஜினி மகாதேவன்
நட்டுவாங்கம் — திருமதி ஞானதர்ஷினி கிருபாகரன்
பாட்டு — திருமதி விமலாதேவி இராசேந்திரம்
மிருதங்கம் — திரு எஸ். மோகன்ராஜ்
வயலின் — திரு. அ. ஜெயராமன்

பதம் —

இது சிங்கார பாவத்தினை வெளிப்படுத்தக்கூடிய உருப்படியாகவே இருக்கின்றது. நாயகி ஜீவாத்மாவாகவும், நாயகன் பரமாத்மாவாகவும் இருப்பதனால் ஜீவன் முக்திக்கு உதவி செய்கிறதாய் அமைந்து மதுர பக்தியை வெளிபபடுத்துகிறது.

## திருகோணமலை இராஜரட்ணம் நடனாலயம் புஸ்பாஞ்சலி

1. அருளினி தயாபரன்
2. மதுசங்கரி தவேந்திரன்
3. அபிசனா திருச்செல்வம்
4. அபிஷா கிறிஷேன் மரினோ நிரோஷன்
5. ஹரினி சௌந்தர் ராஜன்
6. டஷிகா இருதயராஜ்
7. சங்கவி ரவிச்சந்திரன்
8. தரிணிக்கா சந்திரதாஸ்

## பக்கவாத்தியக் கலைஞர்கள்

1. திருமதி ரேணுகா தேவி செல்வபுத்திரன் — நடன அமைப்பு நட்டுவாங்கம்
2. திருமதி பத்மலோஜினி குணராஜசிங்கம் — வாய்ப்பாட்டு
   தி/கலைமகள் மகா வித்தியாலயம் — அன்புவழிபுரம்
3. திருமதி பத்ம கௌரி மோகன சுந்தரம் — வயலின்
   தி/புனித வளநார் தமிழ் வித்தியாலயம்
4. திரு சின்னராசா காண்டீபன் — மிருதங்கம்
   தி/புனித சூசையப்பர் கல்லூரி

## ஜதீஸ்வரம்

1. பவலக்ஷிகா புண்ணியராஜா
2. தேவபாரதி செல்வக்குமார்
3. பிராகாஷினி ஆனந்தராஜ்
4. சிதுர்ஷிகா பாஸ்கரன்
5. சதுஷியா சரவணபவ

6. கிஷோபிதா தேவனேஸ்வரன்
7. லதுர்ஷிகா ஈஸ்வரன்
8. டக்ஷிகா மதியழகன்

## பக்கவாத்தியக் கலைஞர்கள்

1. திருமதி ரேணுகா தேவி செல்வபுத்திரன் — நடன அமைப்பு
   நட்டுவாங்கம்
2. திருமதி பத்மலோஜினி குணராஜசிங்கம் — வாய்ப்பாட்டு
   தி/கலைமகள் மகா வித்தியாலயம் — அன்புவழிபுரம்
3. திருமதி பத்ம கௌரி மோகன சுந்தரம் — வயலின்
   தி/புனித வளநார் தமிழ் வித்தியாலயம்
4. திரு சின்னராசா காண்டீபன் — மிருதங்கம்
   தி/புனித சூசையப்பர் கல்லூரி

## கௌத்துவம்

1. லோஜிதா மகேந்திரன்
2. நர்ஷிகா இராசலிங்கம்
3. சஜிந்தா மகேந்திரநாதன்
4. சுபித்திரா தங்கராஸ்
5. கபிலாஷிதா சிவநாதன்
6. லக்சுமி மகேந்திரராஜா
7. பானுஜா வரதராஜன்
8. சாந்தஸ் பிறீட்டா நேசராஜா


## பக்கவாத்தியக் கலைஞர்கள்

1. திருமதி ரேணுகா தேவி செல்வபுத்திரன் — நடன அமைப்பு
   நட்டுவாங்கம்
2. திருமதி பத்மலோஜினி குணராஜசிங்கம் — வாய்ப்பாட்டு
   தி/கலைமகள் மகா வித்தியாலயம் — அன்புவழிபுரம்
3. திருமதி பத்ம கௌரி மோகன சுந்தரம் — வயலின்
   தி/புனித வளநார் தமிழ் வித்தியாலயம்
4. திரு சின்னராசா காண்டீபன் — மிருதங்கம்
   தி/புனித சூசையப்பர் கல்லூரி


## கனகரத்திரனம் மத்திய மகா வித்தியாலயம் யாழ்ப்பாணம்
## தோடயமங்களம்

**பங்குபற்றிய மாணவிகள்**

செல்வி. அம்சத்வனி தருமு
செல்வி. பவிதா சண்முகநாதன்
செல்வி. நிறோஜினி அன்ரனி பெனான்டோ
செல்வி. சோபனா பாலன்
செல்வி. பிரமிலா பஞ்சாட்சரம்
நடன தயாரிப்பு :- திருமதி தேவராணி கோபாலகிருஸ்ணன்

இவ்வுருப்படி நிகழ்ச்சியின் ஆரம்பத்தில் இடம்பெறும். இறைவன் புகழ்பாடும் இவ்வுருப்படியில் ஸ்ரீராமனுக்கு வணக்கம் செலுத்தும் பாடலுடன் ஆரம்பித்து இறைவனுடைய சிறப்புகளை ஒவ்வொரு பாடலிலும் எடுத்துக்கூறுகிறது. இது ஐந்து கண்டிகைகளாகப் பிரிக்கப்பட்டுள்ளது. அத்துடன் இராகமாலிகையாகவும் தாளமாலிகையாகவும் அமைக்கப்பட்டுள்ளது.

## அரச நடனப் போட்டி - 2011

### இறுதி முடிவுகள் (தமிழ் மொழி)

| இல. | நடனத்தின் தலைப்பு | பெற்ற நிலை | தயாரிப்பாளரின் பெயர் மற்றும் முகவரி | பிரிவு | மாவட்டம் |
|---|---|---|---|---|---|
| 01 | நவீன நடனம் Creative Dance | 1 | **Abhinaya Bara,** 59, Leo Building, Bandaranayake Mw, Ratnapura. | சிரேஷ்ட பிரிவு (19-29) | இரத்தினபுரி |
| 02 | புஸ்பாஞ்சலி Puspanjali | 1 | **Rajaratanam Nadanalayam** No. 450, Thirungasampanthar Rd, Trincomalee | சிறுவர் பிரிவு | திருகோணமலை |
| | | 2 | **J/ Victoria College** Mrs. Sridevi Kannadason, Sulipuram. | | யாழ்ப்பாணம் |
| 03 | ஜதீஸ்வரம் (Jatheeswaram) | 1 | **Rajaratanam Nadanalayam** Renukadivi Selvaputhiran No. 450, Thirungasampanthar Rd, Trincomalee | சிறுவர் பிரிவு | திருகோணமலை |
| | | 2 | **V/ Niruthiya Nehethena** Fine Arts College, No. 26/56, Sivan Kovil Rd, Kovilputhukkulam, Vavuniya | | வவுனியா |
| | | 3 | **J/ Holy Family Convent,** Jaffna | | யாழ்ப்பாணம் |
| 04 | பதம் (Patham) | 1 | **Abinaya Suraby Nadana Manram,** Mrs. K. Gnadharshini Valvai Road, Thondamanaru | சிரேஷ்ட பிரிவு | யாழ்ப்பாணம் |
| 05 | தோடயமங்களம் (Thodayamangalam) | 1 | **J/ Canagaratnam M.M.Vid.** Jaffna | கனிஷ்ட பிரிவு | யாழ்ப்பாணம் |
| 06 | கிராமிய நடனம் (Folk Dance) | 1 | **Abhinaya Bara,** 59, Leo Building, Bandaranayake Mw, Ratnapura. | கனிஷ்ட பிரிவு | இரத்தினபுரி |
| | | 2 | **J/ Udupidi Girls College** Mrs. K. Srisivarani Jaffna | | யாழ்ப்பாணம் |
| 07 | கௌத்துவம் (Gowthuwam) | 1 | **Rajaratanam Nadanalayam** Renukadivi Selvaputhiran No. 450, Thirungasampanthar Rd, Trincomalee | கனிஷ்ட பிரிவு | திருகோணமலை |
| | | 2 | **V/ Niruthiya Nehethena** Fine Arts College, No. 26/56, Sivan Kovil Rd, Kovilputhkkulam, Vavuniya | | வவுனியா |
| 08 | தில்லானா (Thillana) | 1 | **Niruthiya Geethalayam** Mrs. Agalyah Rahabharathy No.02, Pentecostal Lane, Kandy Road, Jaffna | சிரேஷ்ட பிரிவு | யாழ்ப்பாணம் |




புஷ்பாஞ்சலி - சிறுவர் பிரிவு - இஜாரட்ணம் நடனாலயம் திருகோணமலை




ஜதீஸ்வரம் - சிறுவர் பிரிவு - இஜாரட்ணம் நடனாலயம் திருகோணமலை






தோடயமங்களம் - கனிஷ்ட பிரிவு- ய/கனகரட்ணம் ம.ம.வி.
யாழ்ப்பாணம்






தில்லானா - சிரேஷ்ட பிரிவு - நிருத்திய கீதாலயம்
யாழ்ப்பாணம்





கௌத்துவம் - கனிஷ்ட பிரிவு — இஜாரட்ணம் நடனாலயம்
திருகோணமலை





பதம் - சிரேஷ்ட பிரிவு - அபிநய சுரபி நடனமன்றம்
யாழ்ப்பாணம்

## විශේෂ ප්‍රණාමය

* සංස්කෘතික හා කලා කටයුතු ගරු අමාත්‍ය ටී. බී. ඒකනායක මැතිතුමාට,
* සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විමල් රූබසිංහ මහතාට,
* සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විජිත් කණුගල මහතාට,
* නියෝජ්‍ය අධ්‍යක්ෂ ඉන්දික මන්ත්‍රීරත්න මහතාට,
* ගණකාධිකාරී සී.එච්.පී. ලියනආරච්චි මහතාට,
* සහකාර අධ්‍යක්ෂ උදානි වරුසවිතාන මහත්මියට,
* පරිපාලන නිලධාරිනි ශ්‍රීමති සෙනෙවිරත්න මහත්මියට,
* මාණ්ඩලික සහකාර ඩඩ්ලි රාජපක්ෂ මහතාට,
* සංස්කෘතික නිලධාරි නන්දසේන පලිහක්කාර මහතාට,
* ප්‍රවෘත්ති නිලධාරි - ප්‍රේමරත්න ජයවර්ධන මහතාට,
* සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සියළුම සංස්කෘතික නිලධාරින් හා සංස්කෘතික සංවර්ධන සහකාර නිලධාරීන්ට,
* සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය කලමනාකරණ සහකාර සේවයේ සියළුම නිලධාරීන්ට,
* භාෂා පරිවර්තන කටයුතු කරදුන් හිල්මි මාකාර් මහතාට,
* රාජ්‍ය නර්තන හා මුද්‍රානාට්‍ය අනුමණ්ඩලයේ සභාපති රවිබන්ධු විද්‍යාපති මහතා ඇතුළු සියළුම සාමාජික භවතුන්ට,
* සමස්ත නර්තන තරගාවලිය පැවැත්වීමේ දී සම්බන්ධීකරණ කටයුතු සිදුකළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සේවයේ නියුතු සංස්කෘතික නිලධාරින් සහ සංස්කෘතික සංවර්ධන සහකාරවරුන්ට,
* විනිශ්චය මණ්ඩල සාමාජික භවතුන්ට,
* සහය දැක්වූ කාර්යාල කාර්ය සහයක සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රියදුරු මහතුන්ට,
* නර්තන තරගාවලිය සඳහා නිර්මාණ ඉදිරිපත් කළ සියළුම ශිල්පීන්ට,
* 2011 රාජ්‍ය නර්තන උළෙලට සපැමිණි සහෘද ඔබ සැමට.....

## விசேட நன்றிகள்

* கலாசார மற்றும் கலை அலுவல்கள் கௌரவ அமைச்சர் திரு. ரி.பி.ஏக்கநாயக்க அவர்களுக்கு,
* கலாசார மற்றும் கலை அலுவல்கள் அமைச்சின் செயலாளர் திரு. விமல் ரூபசிங்க அவர்களுக்கு,
* கலாசார அலுவல்கள் பணிப்பாளர் திரு. விஜித் கனுகல அவர்களுக்கு,
* பிரதி பணிப்பாளர் இந்திக மந்திரிரத்ன அவர்களுக்கு,
* கணக்காளர் சி.எச்.பீ.லியனஆரச்சி அவர்களுக்கு,
* உதவிப் பணிப்பாளர் திருமதி. உதானி வருசவிதான அவர்களுக்கு,
* நிருவாக உத்தியோகத்தர் திருமதி. ஸ்ரீமதீ செனெவிரத்ன அவர்களுக்கு,
* உதவி நிறைவேற்றாளர் திரு. டட்லி ராஜபக்ஷ அவர்களுக்கு,
* கலாசார உத்தியோகத்தர் திரு. நந்தசேன பலிஹக்கார அவர்களுக்கு,
* செய்தி உத்தியோகத்தர் திரு. பிரேமரத்ன ஜயவர்தன அவர்களுக்கு,
* கலாசார அலுவல்கள் அமைச்சின் சகல கலாசார உத்தியோகத்தர்கள் மற்றும் கலாசார அபிவிருத்தி உத்தியோகத்தர்கள்.
* அரச முகாமைத்துவ உதவியாளர் சேவையில் அனைத்து உத்தியோகத்தர்களுக்கு,
* அரச நடன மற்றும் நாட்டிய நடன குழுவின் தலைவர், ரவிபந்து வித்தியாபதி உட்பட சகல உறுப்பினர்களுக்கு,
* போட்டித் தொடரை நடாத்தும் போது ஒருங்கிணைப்புப் பணிகளை புரிந்த பிரதேச செயலகங்கள் மற்றும் மாவட்டச் செயலகங்களில் சேவையில் ஈடுபட்டிருக்கும் கலாசார உத்தியோகத்தர்கள் மற்றும் கலாசார அபிவிருத்தி உத்தியோகத்தர்களுக்கு,
* நடுவர்கள் சபை உறுப்பினர்களுக்கு
* துணையளித்த அலுவலக உதவியாளர்கள் மற்றும் கலாசார அலுவல்கள் திணைக்களத்தின் சாரதியர்களுக்கு,
* நடனப் போட்டிக்கு நடனங்களை வழங்கிய சகல கலைஞர்களுக்கு,
* 2011 அரச நடன விழாவுக்கு வருகை தந்துள்ள உங்கள் அனைவருக்கும்.

சி. ரவீந்திரன்
தமிழ் மொழி மூல விவாகப்பதிவாளர்
இல - 68/1, சென்மேரிஸ் ஒழுங்கை
கொழும்பு - 15

சி. ரவீந்திரன்
தமிழ் மொழி மூல விவாகப்பதிவாளர்
இல - 68/1, சென்மேரிஸ் ஒழுங்கை
கொழும்பு - 15




සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
கலாசார அலுவல்கள் திணைக்களம்
**Department of Cultural Affairs**

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය
கலாசார மற்றும் கலை அலுவல்கள் அமைச்சு
**Ministry of Culture & the Arts**

8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. 8 ஆம் மாடி, செத்சிறிபாய, பத்தரமுல்லை
8 Floor, Sethsiripaya, Battaramulla.